# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021**

**2024 නොවැම්බර් / දෙසැම්බර්**

**මානවශාස්ත්‍ර පීඨය**

## බෞද්ධ සංස්කෘතිය

**(අධ්‍යයන වර්ෂ 2007 සිට 2016 දක්වා)**

**භාරතීය සංස්කෘතික පසුබිම හා බෞද්ධ සංස්කෘතියේ මූලධර්ම BUCU– E1015**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ප්‍රාග් වෛදික ආගමික චින්තාව තුළ ප්‍රකට වන දේවවාදී ආගමික ප්‍රවණතා අදාළ මූලාශ්‍රය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

02. වෛදික බ්‍රාහ්මණයන් සිදුකළ යාගයන්හි විවිධත්වය සැකෙවින් පහදා යාගයෙහි ලෞකික අරමුණු විමර්ශනය කරන්න.

03. බුදුදහමේ අනාත්මවාදී පදනම සැකෙවින් විමසා ආත්මවාදය බැහැර කිරීමට බුදුදහමේ එන ඉගැන්වීම් සාකච්ඡා කරන්න.

04. මිනිස් සමාජයේ ඒකත්ත්වය බෞද්ධ ඉගැන්වීම් මගින් තහවුරුකොට ඇති ආකාරය සකාරණව පෙන්වා දෙන්න.

05. ශ්‍රමණ සම්ප්‍රදායේ ප්‍රභවය සහ එම සම්ප්‍රදායෙහි ආගමික අභිලාෂයන්ගේ විවිධත්වය ප්‍රකට කරන්න.

06. අකිරියවාදී ඉගැන්වීම් පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයා එම ඉගැන්වීම් සදාචාර සංකල්පය විෂයෙහි ඇතිකරන බලපෑම කෙබඳුදැයි සාකච්ඡා කරන්න.

07. ශ්‍රමණ හා බ්‍රාහ්මණ ආගමික චින්තාවන්හි වෙනස්කම් තුලනාත්මකව විමසන්න.

08. බෞද්ධ ශීල ශික්ෂාවේ ප්‍රභේද සැකෙවින් සාකච්ඡා කොට ශීලය බෞද්ධ නිවන් මාර්ගයේ පදනම වන ආකාරය ප්‍රකට කරන්න.

09. ත්‍රිශික්ෂාව මගින් පුද්ගලයාගේ චරිත සංවර්ධනය කෙසේ සිදුවන්නේදැයි පෙන්වා දෙන්න.

10. සිතීමට හා විමසීමට යොමු කරන ධර්ම මාර්ගයක් ලෙස බෞද්ධ ඉගැන්වීම් කෙසේ හඳුනාගත හැකිදැයි පැහැදිලි කරන්න.

************************************